**නෙළුව ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 21 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 19 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

------------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට නෙළුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------------------

#### 1.3.1. ගිණුම්කරණ අඩුපාඩු

**----------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.234,970 ක් වූ ගෙවිය යුතු වියදම් සඳහා ණයහිමි ප්‍රතිපාදන ඇතිකර නොතිබුණි. | ණයහිමි ප්‍රතිපාදන ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල විගණන ගාස්තු සඳහා ණයහිමි ප්‍රතිපාදන ඇතිකර නොතිබුණි. | ණයහිමි ප්‍රතිපාදන ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | ඉකුත් වර්ෂයේ රු.38,394,004 ක් වැයකර ඉදි කරන ලද පහල මිල්ලව පාලම හා රු.1,393,510 ක් වැයකර ඉදිකල කසළ ගබඩා අංගනය ගිණුම් ගතකර නොතිබුණි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් රු.7,141,037 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදනය කර නොතිබුණි. | ණයහිමි ප්‍රතිපාදන නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඉ) | සභාව සතුව භෞතිකව නොපවතින රු.45,665 ක් වූ ඕවර්සියර් ක්ෂේත්‍ර ගබඩා තොගයක් ගිණුම් ගතකර තිබුණි | ගබඩා තොග නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දූලි ඇල්ල, පොළ හා මාළු වෙළඳසැල් කුලී ටෙන්ඩරයන්ගේ රු.1,087,583 ක් හිඟ ආදායම් ගිණුම් ගතකර නොතිබුණි. | හිඟ ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉතිරි කිරීමේ ගිණුමෙහි රු.41,548 ක් වූ පොළිය ගිණුම් ගතකර නොතිබුණි. | පොලී ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී රු.161,250 ක් ගිණුම්ගත කර නොතිබුණි. | පොලී ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 1.3.2 නොසැසඳු ගිණුම්

----------------------

පහත සඳහන් නොසැසඳීම් නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| ---------------------------- | | ------------ | -------------------- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 07 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන / උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.61,600,177 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | බැංකු ජංගම ගිණුම් 03 කට අදාළව ශේෂ පිරික්සුමේ දැක්වෙන ශේෂයන් සහ මුදල් පොත්වල දැක්වෙන ශේෂයන් අතර රු.73,362 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුමේ දැක්වෙන වටිනාකම හා ප්‍රධාන ලෙජරයේ දැක්වෙන වටිනාකම අතර රු.6,405,790 ක වෙනසක් විය. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 1.3.3 අවිනිශ්චිත ගිණුම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙනෙමින් පවතින රු.21,176 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය හඳුනාගෙන අදාළ ගැලපීම් කර, ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අවිනිශ්චිත ගිණුමේ ශේෂ නිරවුල් කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) ලැබිය යුතු ගිණුම්** | | |
| (i) 2014 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති 07 ක් වෙනුවෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු.3,572,194 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී අයකර ගන්නා බව දන්වමි. |
| (ii) 2008 වර්ෂයේ සිටම හිඟව පවතින සතිපොළ එක්වන් මුදල් රු.478,300 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී අයකර ගන්නා බව දන්වමි. |

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

| | | | |
|---|---|---|---|
| (i) | 2016 වර්ෂයේ සිට පොත්වල දැක්වෙන රු.260,222 ක් වූ පොදු සැපයුම් ණයහිමි ශේෂය නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කර ගන්නා බව දන්වමි. |
| (ii) | රු.1,225,846 ක් වූ ප්‍රාග්ධන වියදම් ණයහිමි ශේෂය නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කර ගන්නා බව දන්වමි. |

**1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**තොරතුරු ඉදිරිපත් නොකිරීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතුව රු.126,577,322 ක් වූ ගිණුම් විෂයයන් 17 ක් සඳහා අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | **1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති** | | | |
| | (i) රීති 33 | අක්කර බදු ගෙවීම් පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තුවක් සහ දේපල තහනම් කිරීමේ වරෙන්තු ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | රීති 193 | අයවැය සමඟ වැය විෂයයන් සසඳා අතිරික්ත හා ඌණතාවලට හේතු දැක්වෙන ප්‍රකාශයක් පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |
| (iii) | රීති 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වර්ෂයකට වරක් හෝ සමීක්ෂණය කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | |
| (i) | මුදල් රෙගුලාසි 702(3) | කොන්ත්‍රාත් සම්බන්ධව අත්සන් කරනු ලබන ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවේ. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කරමි. |
| (ii) | මුදල් රෙගුලාසි 1645-1646 | ධාවන තත්ත්වයේ පවතින වාහන 04 කට අදාළ දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවේ. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කරමි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන 08 හි ඉන්ධන දහන පරීක්ෂාව කර නොතිබුණි. | ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් සිදුකළ යුතුවේ. | ඉදිරියේ දී ඉන්ධන පරීක්ෂාවක් සිදු කරමි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,121,063 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,159,098 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

---------------------------

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

----------------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | 2019 බිල් කළ ආදායම | 2019 රැස් කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස් කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 515,590 | 393,798 | 389,822 | 67,659 | 415,500 | 446,990 | 467,852 | 63,683 |
| කුලී | 7,565,850 | 7,659,835 | 6,643,383 | 1,601,398 | 7,369,300 | 7,264,900 | 6,960,092 | 584,946 |
| බලපත්‍ර ගාස්තු | 263,000 | 189,119 | 189,119 | 17,835 | 184,300 | 201,003 | 201,003 | 17,835 |
| සේවා සඳහා ගාස්තු | 1,059,500 | 1,422,924 | 1,422,924 | - | 853,150 | 1,196,752 | 1,196,752 | - |
| | 9,403,940 | 9,665,676 | 8,645,248 | 1,686,892 | 8,822,250 | 9,109,645 | 8,825,699 | 666,464 |

### 2.2.2 වරිපනම් හා බදු

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) අක්කර බදු** | | |
| සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂයට අදාළ අයකර ගත යුතුව තිබුණු රු.27,364 ක් අක්කර බදු අයකර ගෙන නොතිබුණි. | හිඟ අක්කර බදු අයකර ගත යුතුවේ. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමි. |
| **(ආ) ව්‍යාපාර බදු** | | |
| ඉකුත් වර්ෂයේ සිට හිඟව පවතින රු.40,295 ක් වූ හිඟ වෙළඳ බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී හිඟ බදු අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.3 කුලී

------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) කඩ කුලී** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.513,816 ක හිඟ කඩ කුලී ශේෂයක් පැවතුණි. | හිඟ කඩ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී හිඟ කඩ කුලී අයකර ගැනීමට කටයුතු කරමි. |

(ආ) වෙළඳ අයිතිය බදුදීම

| | | | |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂට සතිපොළ, මාළු ලෑල්ල සහ දූලි ඇල්ල පරිශ්‍රය ටෙන්ඩර් කිරීමෙන් අයකර ගතයුතු බදු කුලිය රු.987,400 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ii) | ටෙන්ඩර් මත බදු දී තිබූ මහජන පොලෙහි විදුලි බිල් පත් හා ජල බිල් පත් සභාව විසින් ගෙවීම නිසා රු.118,520 ක පාඩුවක් සිදු වී තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.21,360 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.9,130,160 ක් ලැබිය යුතුව තිබුණි. එහෙත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ වාර්තා අනුව මෙම වටිනාකම් අසමාන විය. | ආදායම් ලේඛන විධිමත්ව පවත්වා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) ක්‍රියාකාරී සැලැස්ම** | | |
| සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුවේ. | ඉදිරියේ දී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි. |
| **(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම** | | |
| ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන, පරිසර කටයුතු, ග්‍රාමීය කර්මාන්ත, විදුලිබල සහ ග්‍රාමීය හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය විසින් හරිත පරිසර කලාප ඇති කිරීම සඳහා 2017 වර්ෂය තුළ ලබා දී තිබූ රු.375,125 න් රු.232,625 කට අදාළ ව්‍යාපෘති ඉටුකර නොතිබුණි. | ව්‍යාපෘතිය කඩිනමින් ඉටුකළ යුතුවේ. | ඉදිරියේ දී ව්‍යාපෘතිය ඉටුකර ගන්නා බව දන්වමි. |
| **(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය** | | |
| ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වෙනම ඒකකයක් පිහිටුවා දිගුකාලීන සැලැස්මක් සකස් කළයුතු වුවද, එවැනි වැඩපිළිවෙලකට සභාව අවතීර්ණ වී නොතිබුණි. | කසළ බැහැර කිරීම සඳහා දීර්ඝකාලීන වැඩපිළිවෙලක් සකස් කළ යුතුවේ. | ව්‍යාපෘතියක් සකස් කරමින් පවතී. |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

| | | |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සඳහා වන දීර්ඝකාලීන සැලසුම් සකස් කර ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවිය යුතුවේ. | බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට ඉදිරියේ දී සැලැස්මක් සකස් කරමි. |

**3.2** **මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) සේවක පුරප්පාඩු හා අතිරික්තතා** | | |
| අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 10 සම්පූර්ණ කර ගැනීමට හා 05 ක් වූ අතිරික්ත විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමටත් කටයුතු කළ යුතුවේ. | තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කරමි. |
| **(ආ) සේවක ණය** | | |
| 2018 වර්ෂයේ දී විශ්‍රාම ගිය සේවකයෙකුගෙන් අයවිය යුතුව තිබුණු රු.124,890 ක සේවක ණය ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගත යුතුවේ. | හිඟ ණය ශේෂ ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමි. |

**3.3** **වත්කම් කළමනාකරණය**

-----------------------------------

**3.3.1** **පවරා නොගත් වත්කම්**

---------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2008 සිට 2015 වර්ෂය අතර සභාවට ලැබී තිබුණු රු.37,053,200 ක් වටිනාකමින් යුත් වාහන 07 ක් හා වටිනාකම සඳහන් නොවූ වාහනයක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහනවල අයිතිය පවරා ගත යුතුවේ. | ඉදිරියේ දී අයිතිය පවරා ගන්නා බව දන්වමි. |

**3.3.2** **නිෂ්ක්‍රිය / ඌන උපයෝජිත වත්කම්**

-------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අත් ට්‍රැක්ටරය 2000 වර්ෂයේ සිටද හොයිස්ටරය 2014 වර්ෂයේ සිට ද භාවිතයට ගැනීමෙන් තොරව පැවතුණි. | අළුත්වැඩියා කළ නොහැකි නම් අපහරණය කළ යුතුවේ. | ඉදිරියේ දී වෙන්දේසි කරන බව දන්වමි. |

## 3.4 ප්‍රසම්පාදනය

### 3.4.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩ සැපයීම් හා සේවා වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේ දී ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කරන බව දන්වමි. |

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | විගණන සැලැස්මක් සකස් කර, විධිමත් අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුවේ. | ඉදිරියේ දී මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරමි. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ එක් විගණන හා කළමනාකරණ කමිටුවක් පමණක් පවත්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේ දී චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරමි. |